සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය - I, II** | **කාලය පැය 03 යි**

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

නම/ විභාග අංකය:

## I - කොටස

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ග්‍රීක සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලනය තුළ පාලන කටයුතුවලට සහභාගී වීමට අවස්ථාව ලැබුනේ,
(1) කාන්තාවන්ට පමණි. (2) ළමුන්ට පමණි.
(3) වහල් හිමි රදළයන්ට පමණි. (4) විදේශිකයන්ට පමණි.

02. තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සියලු දෙනාම සම්බන්ධ වීම හඳුන්වන්නේ,
(1) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙනි. (2) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙනි.
(3) ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙනි. (4) නියෝජනය යනුවෙනි.

03. අවුරුදු 18 සම්පූර්ණ කළ ශ්‍රී ලාංකීක පුරවැසියෙකුට හිමිවන අයිතිවාසිකමක් වන්නේ,
(1) ජීවත් වීමේ අයිතිය. (2) ඡන්ද අයිතිය.
(3) අධ්‍යාපනය ලැබීමේ අයිතිය. (4) ආරක්ෂාව ලැබීමේ අයිතිය.

04. වර්තමාන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව සඳහා නියෝජිතයින් තෝරා ගැනීමට භාවිත කරන නියෝජන ක්‍රමය වන්නේ,
(1) සරල බහුතර නියෝජන ක්‍රමය යි. (2) බහුතර නියෝජන ක්‍රමය යි.
(3) ඒකාන්තර බහුතර ක්‍රමය යි. (4) සමානුපාතික නියෝජන ක්‍රමය යි.

05. රටක මූලික නීතිය වන්නේ,
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (2) අපරාධ නීතිය
(3) සිවිල් නීතිය (4) උඩරට නීතිය

06. බහු පක්ෂ ක්‍රමයක් ඇති රටකට නිදසුනක් වන්නේ,
(1) චීනය (2) කියුබාව (3) ශ්‍රී ලංකාව (4) ඇමරිකාව

07. මිනිසාට තම සමාජ ජීවිතය සම්පූර්ණ කර ගැනීමට සමාජයෙන් ලැබෙන හිමිකම් හඳුන්වන්නේ,
(1) නිදහස යනුවෙනි. (2) සමානාත්මතාව යනුවෙනි.
(3) අයිතිවාසිකම් යනුවෙනි. (4) යුතුකම් යනුවෙනි.

08. දේශපාලන සංවිධානයක් ලෙස ජාතික රාජ්‍යය යුරෝපයේ ස්ථාපිත වන්නේ,
(1) 15 වන සියවසෙන් පසුව ය. (2) 20 වන සියවසෙන් පසුව ය.
(3) 17 වන සියවසෙන් පසුව ය. (4) 14 වන සියවසෙන් පසුව ය.

09. එක් මධ්‍යම ආණ්ඩුවක් යටතේ බලය ඒකරාශී වූ රාජ්‍යයන් හඳුන්වන්නේ,
(1) සන්ධීය රාජ්‍යයන් ලෙසිනි. (2) ඒකීය රාජ්‍යයන් ලෙසිනි.
(3) අර්ධ සන්ධීය රාජ්‍යයන් ලෙසිනි. (4) සහ සන්ධීය රාජ්‍යයන් ලෙසිනි.

10. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,
(1) ජනාධිපතිවරයා ය. (2) මහ ඇමතිවරයා ය.
(3) ආණ්ඩුකාරවරයා ය. (4) අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය යි.

11. මහ නගර සභාවක ප්‍රධානියා හඳුන්වනු ලබන්නේ,
(1) සභාපති ලෙස ය. (2) නගරාධිපති ලෙස ය.
(3) මන්ත්‍රී ලෙස ය. (4) කොමසාරිස් ලෙස ය.

12. ස්විස්ටර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව සතු බලයක් වන්නේ,
(1) විදේශ කටයුතු (2) මහා මාර්ග (3) ආගමන (4) බැංකු කටයුතු

13. සන්ධීය රාජ්‍යයක ප්‍රාදේශීය ආණ්ඩු සාමාන්‍යයෙන් හඳුන්වන්නේ,
(1) පළාත් සභා යනුවෙනි. (2) නගර සභා යනුවෙනි.
(3) ප්‍රාදේශීය සභා යනුවෙනි. (4) ප්‍රාන්ත යනුවෙනි.

14. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමට ගත් උත්සහයක් වන්නේ,
(1) ගම් සභා ක්‍රමය ස්ථාපිත කිරීම. (2) විධායක කාරක සභාවක් පිහිටුවීම.
(3) මහ නගර සභා ස්ථාපිත කිරීම. (4) ප්‍රාදේශීය සභා ස්ථාපිත කිරීම.

15. ස්විස්ටර්ලන්තයේ සාමූහික විධායකය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) සන්ධීය සභාව (2) සන්ධීය මහා මණ්ඩලය
(3) නගර සභාව (4) කොන්ග්‍රස් සභාව

16. ආර්ථික භාණ්ඩයකට උදාහරණයක් වන්නේ,
(1) ජලය (2) ඇඳුම් (3) වාතය (4) හිරු එළිය

17. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභාවක මහ ඇමතිවරයා ද ඇතුළුව සිටිය යුතු අමාත්‍යවරු ගණන වන්නේ,
(1) 05 (2) 04 (3) 03 (4) 06

18. ඇමරිකා එක්සත් ජනපදයේ විධායක බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ,
(1) අගමැති විසිනි. (2) අමාත්‍ය මණ්ඩලය විසිනි.
(3) උප ජනාධිපති විසිනි. (4) ජනාධිපති විසිනි.

19. සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ඉදිරිපත් කර ඇති චින්තකයෙක් වන්නේ මින් කවුරුන් ද?
(1) ඒබ්‍රහම් ලින්කන් (2) ලැස්කි (3) ටී. බී. ටයිලර් (4) ඒ. වී. ඩයිසි

20. ඉතා සංකීර්ණ බහු සංස්කෘතික සමාජයක් ඇති රටක් වන්නේ,
(1) චීනය (2) එංගලන්තය (3) ජපානය (4) ඉන්දියාව

21. ක්‍රි. පූ. 6 වැනි සියවසේ දී සමූහාණ්ඩු පාලන ක්‍රමයක් පැවති ඉන්දීය ජනපදය වන්නේ,
(1) වජ්ජි (2) මගධ (3) කෝසල (4) පන්චාල

22. අධිකරණයේ කාර්යයන් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
    (1) යුක්තිය ඉටු කිරීම. (2) නීති ක්‍රියාත්මක කිරීම.
    (3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම. (4) ව්‍යවස්ථාමය ගැටලු විසඳීම.

23. පළාත් සභාවක ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ,
    (1) ජනාදිපතිවරයා විසිනි. (2) අගමැතිවරයා විසිනි.
    (3) මහජන ඡන්දයෙනි. (4) මහ ඇමතිවරයා විසිනි.

24. මිනිසාගේ පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය මූලික දේවල් හඳුන්වන්නේ,
    (1) වුවමනා යනුවෙනි. (2) අයිතිවාසිකම් යනුවෙනි.
    (3) අවශ්‍යතා යනුවෙනි. (4) යුතුකම් යනුවෙනි.

25. රටක සියල්ලට ම ඉහළින් නීතිය පැවතීම හඳුන්වන්නේ,
    (1) නීතියේ යුක්තිය ලෙසිනි. (2) නීතියේ සමානාත්මතාව ලෙසිනි.
    (3) නීතියේ සාධාරණත්වය ලෙසිනි. (4) නීතියේ ආධිපත්‍යය ලෙසිනි.

26. ශ්‍රී ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක අතුරින් කුඩා ම භූමි ප්‍රමාණයක් ඇති දිස්ත්‍රික්කය වන්නේ,
    (1) කුරුණෑගල (2) කොළඹ (3) ගම්පහ (4) පුත්තලම

27. පළාත් සභාවක මහ ඇමතිවරයා පත් කිරීම බලය ඇත්තේ,
    (1) ජනධිපතිවරයාටයි. (2) පක්ෂ නායකයාටයි.
    (3) ආණ්ඩුකාරවරයාටයි. (4) මැතිවරණ කොමිසමටය.

28. රාජ්‍යයක පරමාධිපත්‍ය බලය පවතින්නේ,
    (1) මහජනතාව වෙතය. (2) විධායකය වෙතය.
    (3) ව්‍යවස්ථාදායකය වෙතය. (4) අධිකරණ වෙතය.

29. නියම කරන ලද වයස් සීමාවක් ඉක්ම වූ ජනතාවට පාලකයන් තෝරා ගැනීමට ඇති බලය හඳුන්වන්නේ,
    (1) ස්වාධිපති ඡන්ද බලය ලෙසිනි. (2) සමානුපාතික ඡන්ද බලය ලෙසිනි.
    (3) සර්ව ජන ඡන්ද බලය ලෙසිනි. (4) නියෝජිත ඡන්ද බලය ලෙසිනි.

30. රටක ජනතාව විසින් පිළිගෙන ''සම්මත කරගත් ක්‍රියා කිරීමේ විධි'' හඳුන්වනු ලබන්නේ,
    (1) සිරිත්විරිත් ලෙස ය. (2) සාරධර්ම ලෙස ය.
    (3) ආචාර ධර්ම ලෙස ය. (4) සංස්කෘතිය ලෙස ය.

31. යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක වන්නේ එංගලන්තය හා ප්‍රංශයයි. ඉන් පසු ජාතික රාජ්‍ය ලෙස සංවිධානය වූ රාජ්‍ය දෙක වන්නේ,
    (1) ඕලන්දය හා පෘතුගාලය. (2) ජර්මනිය හා ඉතාලිය.
    (3) ස්පාඤ්ඤය හා ඉතාලිය. (4) කැනඩාව හා ජර්මනිය.

32. ස්විස්ටර්ලන්ත දේශපාලන ව්‍යුහය තුළ බලතල ක්‍රියාවට නැංවීමේ දී ගැටලුකාරී තත්වයක් ඇති වුවහොත් එය විසඳීමේ බලය ඇත්තේ,
    (1) සන්ධීය මහා මණ්ඩලයට ය. (2) කැන්ටන් අධිකරණයට ය.
    (3) ජාතික සභාවට ය. (4) විධායක සභාවට ය.

33. දළදා මාලිගාව,

(1) කතෝලිකයන්ගේ පූජනීය ස්ථානයකි. (2) හින්දු පූජනීය ස්ථානයකි.

(3) බෞද්ධ පූජනීය ස්ථානයකි. (4) ඉස්ලාම් පූජනීය ස්ථානයකි.

34. ඉස්ලාම් ආගමට අයත් ආගමික ග්‍රන්ථයක් වන්නේ,

(1) බයිබලය (2) අල් කුර් ආනය (3) භගවත් ගීතාව (4) ධම්ම පදය

35. ස්විස්ටර්ලන්තය සමන්විතවන කැන්ටන් ගණන වන්නේ,

(1) 50 (2) 29 (3) 35 (4) 26

36. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පුරවැසියෙකු සතු විය යුතු ගුණාංගයක් වන්නේ,

(1) බහුතර මතයට ගරු කිරීම. (2) අන්මත නොසැලකීම.

(3) නීතියට ගරු නොකිරීම. (4) සහයෝගයෙන් කටයුතු නොකිරීම.

37. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ සිට ප්‍රදේශීය මට්ටම දක්වා පරිපාලන බලතල විමධ්‍යගත කිරීමේ දී පහළම මට්ටමේ සිටින නිලධාරියා වන්නේ,

(1) අමාත්‍යාංශ ලේකම් (2) ග්‍රාම නිලධාරී (3) දිස්ත්‍රික් ලේකම් (4) ප්‍රදේශීය ලේකම්

38. සදාචාරාත්මක යුතුකමක් ලෙස සැලකිය හැක්කේ,

(1) වැඩිහිටියන්ට ගරු කිරීම. (2) පවතින නීතියට ගරු කිරීම.

(3) රජයට නියමිත බදු ගෙවීම. (4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.

- **යහපාලනයක් සඳහා එකිනෙකාගේ දේශපාලන, සමාජ, ආර්ථික හා සංස්කෘතික අනන්‍යතාවයට ගරු කිරීම වැදගත් වේ. පහත කරුණු ආශ්‍රයෙන් 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - දේශපාලන නායකත්වයට ගරු කිරීම. B - කැමති ආගමක් ඇදැහීම.

C - තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීම. D - විවිධ උත්සව පැවැත්වීම.

E - නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම. F - නිදහසේ ගමනාගමනය

39. යහපාලන සාර්ථක කර ගැනීමට සමාජයක් තුළ තහවරු කරගත යුතු සමාජ හා සංස්කෘතික සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABC (2) ACE (3) ADF (4) BDF

40. යහපාලනය සාර්ථක කර ගැනීමට සමාජයක් තුළ තහවුරු කරගත යුතු දේශපාලන සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABC (2) ACE (3) ADF (4) BDF

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

නම/ විභාග අංකය:

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. (i) පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු දෙකක් ලියන්න.

(ii) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර ඇති චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.

(iii) ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා භාවිත කරන ප්‍රධාන නිර්ණායක දෙක ලියන්න.

(iv) පරමාධිපත්‍යය බලයට අයත් බලතල දෙකක් ලියන්න.

(v) ඇමරිකාවේ ප්‍රාන්ත රාජ්‍යයන්ට හිමි බලතල දෙකක් ලියන්න.

(vi) රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතු දෙකක් ලියන්න.

(vii) ශ්‍රී ලංකාවේ ජීවත් වන ජන වර්ග දෙකක් නම් කරන්න.

(viii) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීම නිසා ලැබෙන වාසි 02 ක් ලියන්න.

(ix) පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු බලතල දෙකක් ලියන්න.

(x) මූලික ආර්ථික ප්‍රශ්න දෙකක් නම් කරන්න.

02. වර්තමාන ලෝකයේ ජනප්‍රියම පාලන ක්‍රමයක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය හැඳින්විය හැකිය.

(i) ප්‍රජාතන්ත්‍රවාදය වැදගත්වන ආකාර දෙක ලියන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන දේශපාලන පක්ෂ 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ 02 ක් නම් කරන්න. (ල. 02)

(b) ඉන් එකක් පිළිබඳව විස්තර කරන්න. (ල. 03)

03. රාජ්‍යයක පාලන කටයුතු පවත්වාගෙන යාමට එම රාජ්‍යයට ඇති හැකියාව බලය ලෙස හැඳින්විය.

(i) බලය විවිධ ස්වරූපවලින් පවතී. ඉන් ස්වරූප දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ඒකීය රාජ්‍යයක ලක්ෂණ 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) (a) සන්ධීය ආණ්ඩුක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 02)

(b) ඉන් එක් යහපත් ලක්ෂණයක් පිළිබඳව විස්තර කරන්න. (ල. 03)

04. අපගේ සියලු ක්‍රියාකාරකම් හා සිතුම් පැතුම් සංස්කෘතිය යන්නට අයත් වේ.

(i) බහු සංස්කෘතික සමාජයක යහපැවැත් ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුණ කළයුතු ගුණාංග 02 ක් ලියන්න. (ල. 02)

(ii) යහපාලනයක මූලික ගුණාංග 03 ක් ලියන්න. (ල. 03)

(iii) (a) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක 02 ක් නම් කරන්න. (ල. 02)

(b) ඉන් එක් සාධකයක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

05. සමාජයේ උත්තරීතරම සංවිධානය වන්නේ රාජ්‍යයි.

(i) රාජ්‍යයේ මූලික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑ හේතු 03 නම් කරන්න. (ල. 03)

(iii) (a) නූතන රාජ්‍යන්හි දක්නට ලැබෙන ආණ්ඩුක්‍රම දෙක නම් කරන්න. (ල. 02)

(b) ඉන් එක් ආණ්ඩුක්‍රමයක ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

06. ආර්ථිකයක සම්පත් මිනිස් වුවමනා ඉටු කර ගත හැකි ආකාරයට වෙනස් කිරීම නිෂ්පාදනය නම් වේ.

(i) නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක ලියන්න. (ල. 02)

(ii) නිෂ්පාදන සාධක 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) (a) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලීන් ප්‍රධාන කොටස් 03 කට බෙදිය හැකිය ඉන් කොටස් 02 ක් නම් කරන්න. (ල. 02)

(b) ඉන් එක් ක්‍රියාවලියක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

07. ශ්‍රී ලංකාවේ ජන වාර්ගික ගැටළුව විසඳීම සඳහා බලය බෙදා හැරීම එක් විසඳුමකි.

(i) ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමට ගෙන ඇති උත්සහයන් දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) පළාත් සභාවක මහ ඇමති සහ අමාත්‍ය මණ්ඩලය සතු බලතල හා කාර්යයන් 03 ක් ලියන්න. (ල. 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ පළාත් සභා ලැයිස්තු 03 ක් පදනම් කරගෙන බලතල වර්ගීකරණය කර ඇත. ඉන් සමගාමී ලැයිස්තුවට අයත් බලතල දෙකක් ලියන්න. (ල. 02)

(b) ඉන් එක් බලතලයක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2025**

**10 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(2) | 4 -(4) | 5 -(1) | 6 -(3) | 7 -(3) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11 -(2) | 12 -(1) | 13 -(4) | 14 -(4) | 15 -(1) | 16 -(2) | 17 -(1) | 18 -(4) | 19 -(3) | 20 -(4) |
| 21 -(1) | 22 -(2) | 23 -(1) | 24 -(3) | 25 -(4) | 26 -(2) | 27 -(3) | 28 -(1) | 29 -(3) | 30 -(4) |
| 31 -(2) | 32 -(1) | 33 -(3) | 34 -(2) | 35 -(4) | 36 -(1) | 37 -(2) | 38 -(1) | 39 -(4) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i)
- වර්තමාන රාජ්‍යය භූමි ප්‍රමාණයෙන් විශාල වීම.
- වර්තමාන රාජ්‍යය අධික ජනගහනයකින් යුක්ත වීම.
- සියලු පුරවැසියන් එක් ස්ථානයකට රැස් කිරීමේ අපහසුතාව
- සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.

(ii) ඒබ්‍රහම් ලින්කන් / සීලර්

(iii) භූමිය හා ජන ගහනය

(iv) මූලික අයිතිවාසිකම් / පාලන බලතල / ඡන්ද බලය

(v) අධ්‍යාපන, සෞඛ්‍ය, නිවාස ඉදි කිරීම්, පළාත පාලනය, මහා මර්ග

(vi)
- අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම.
- රාජ්‍යය පාලනයේ අකාර්යක්ෂමතාව.
- රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම.
- නිලධාරීවාදය
- අල්ලස හා දූෂණය ඉහළ යාම.
- රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොර වීම.

(vii) සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, ශ්‍රී ලංකා යෝනක, බර්ගර්

(viii)
- ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
- ගැටුම් අවම වේ.
- අන්‍යෝන්‍යය සුහදත්වය හා විශ්වාසය වර්ධනය වේ.
- මිනිස් නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වේ ..........

(ix)
- පළාත් සභාව කැඳවීම වාර අවසාන කිරීම හා විසුරුවා හැරීම.
- පළාත් සභාව ඇමතීම හා සංදේශ යැවීම.
- ප්‍රධාන ඇමතිවරයා පත් කිරීම අමාත්‍ය මණ්ඩලය හා අනෙක් පළාත් විධායක නිළධාරීන් පත් කිරීම.
- මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කිරීම.

(x)
- කුමක් කොපමණ නිෂ්පාදනය කරන්නේ ද?
- කෙසේ නිෂ්පාදනය කරන්නේ ද?
- කා සඳහා නිෂ්පාදනය කරන්නේ ද?

02. (i) ජීවන ක්‍රමයක් හා පාලන ක්‍රමයක්

(ii) නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න.

(iii) (a)
- සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන ආණ්ඩු හා පාලකයින් තෝරා ගැනීම.
- තරගකාරී පක්ෂ ක්‍රමය.
- ඡන්ද කොට්ඨාස ක්‍රමය.
- නිදහස් හා සාධාරණ මැතිවරණ.
- ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් තිබීම.
- නිදහස සමානාත්මතාව හා අයිතිවාසිකම්.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීම.
- මාධ්‍යය නිදහස හා තොරතුරු ලබා ගැනීමේ අයිතිය.
- අධිකරණයේ ස්වාධීනත්වය.

(b) විස්තර කිරීමකට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

03. (i) දේශපාලන බලය, පරිපාලන බලය, ආර්ථික බලය, සමාජ බලය

(ii)
- ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාත්මක වීම.
- පරිපාලන බලතල විමධ්‍යගත කර තිබීම.
- මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකය මගින් සම්මත කරගත් පනතක් මගින් පමණක් පරිපාලන බලතල විමධ්‍යගත කිරීම.
- විමධ්‍යගත කරන ලද පරිපාලන බලතල මධ්‍යම ආණ්ඩුවට ඕනෑම අවස්ථාවක නැවත පවරා ගත හැකි වීම.

(iii) (a)
- විවිධත්වයක් පවතින ජන සමාජයක් තුළ විවිධත්වයට ගරු කිරීම මගින් පොදු ජාතිකත්වයක් ගොඩ නැගීම.
- භූමි ප්‍රමාණය විශාල රාජ්‍යවලට පරිපාලන තීන්දු ගැනීමට පහසු වීම.
- මධ්‍යම ආණ්ඩුවට අත්තනෝමතික වීමට නොහැකි වීම.
- ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුව ශක්තිමත් වීම.

(b) විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

04. (i)
- එකිනෙකාට ගරු කිරීම.
- අන්‍ය ආගම්වලට අවමන් නොකිරීම.
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම.
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
- සාමූහිකත්වය වර්ධනය කිරීම .......... (පිටුව 66)

(ii)
- දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍යය පාලනය
- නිදහස හා සාධාරණත්වය තහවුරු කිරීම.
- නීතියේ ආධිපත්‍යයට හා අධිකරණයේ ස්වාධීපනත්වයට ගරු කිරීම.
- අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම.
- මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම....... (පිටුව 64)

(iii) (a) පිහිටීම, සංක්‍රමණ, ආක්‍රමණ, විවිධ ජාතීන් වෙළඳාම සඳහා පැමිණීම, ශ්‍රමිකයින් ගෙන්වා ගැනීම.

(b) විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

05. (i) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය

(ii)
- රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ
- පුනරුදය
- වැඩවසම් ක්‍රමය බිඳ වැටී ධනවාදී ආර්ථික ක්‍රමය ගොඩ නැගීම.
- විද්‍යාත්මක දැනුම වර්ධනය.

(iii) (a) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය හා ජනාධිපති ආණ්ඩු ක්‍රමය

(b) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වීම / ව්‍යවස්ථාධායකය හා විදායකය අතර ඍජු සම්බන්ධතා පැවැත්වීම / විධායකය සිය කටයුතු සම්බන්ධයෙන් සාමූහිකව වගකීම / විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාධායකයට හැකිවීම. / නාමික හා සත්‍ය වශයෙන් ද්විත්ව විධායකයක් පැවතීම

ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

විධායකය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි / රාජ්‍ය නායකයා හා ආණ්ඩුවේ නායකයා ජනාධිපති වීම / විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට ඍජුවම බැඳී නැත / ව්‍යවස්ථාදායකය මගින් විධායකය ඍජුවම පාලනය කිරීමක් සිදුනොවේ

06. (i) ප්‍රාග්ධන සූක්ෂම හා ශ්‍රම සූක්ෂම

(ii) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය

(iii) (a) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය. (b) නිවැරදි කරුණුවලට ලකුණු ලබා දෙන්න.

07. (i)
- උඩරට ප්‍රදේශ සන්ධීය රාජ්‍යයක් ලබා දීම පිළිබඳ යෝජනා
- බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම
- ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුම

(ii)
- පළාත් ආණ්ඩුකාරවරයාට උපදෙස් ලබා දීම.
- පළලාත් අයවැය ලේඛනය සකස් කිරීම.
- පළාතේ ආර්ථික සංවර්ධන හා පරිපාලන සැලසුම් සකස් කිරීම මෙන් ම ඒවා ක්‍රියාත්මක කිරීම.

(iii) (a)
- සැලසුම් කිරීම ජාතික නිවාස ඉදි කිරීම සමාජ සේවා හා පුනරුත්ථාපනය.
- කෘෂිකර්මය හා ගොවිජන සේවා.

(b) විස්තර කිරීමට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.